# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2042/11 - 2017 ඔක්තෝබර් මස 24 වැනි අඟහරුවාදා - 2017.10.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* ජා/2/2/5/1.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය:* 4-3/7/2016/එච්ඩබ්/28.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම් පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 194 දඬුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දඬුගම ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක ගම් 4050 හා 2017.04.26 දිනැති පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0092 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි 1 (කැබලි 01) ට මායිම්;

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: දොලේවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ජා ඇල, තුඩැල්ල, විජය පාර, අංක 72 හි පදිංචි ඩබ්ලිව්. එස්. එම්. එස්. ප්‍රනාන්දු; ප්‍රමාණය: හෙක්. 0.0092.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2017.11.24 වැනි දින පෙ.ව. 9.30 ට ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ වියයුතුයි.

තව ද 2017.11.17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ, හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි ද පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කල යුතුය.

ප්‍රාදේශීය ලේකම්,
ජා ඇල.

2017 ඔක්තෝබර් මස 23 වැනි දින
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ජා ඇල.

11-434